**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - 2021**

**---------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අහිතකර මතය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල නව සංශෝධිත පනතේ 22 වගන්තිය යටතේ පනවා ඇති විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව **අහිතකර** මතය ප්‍රකාශ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලයේ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සම්පත් පිළිබඳ ජාතික සංචිතයක් පිහිටුවීම, සංරක්ෂණය කිරීම හා පරිපාලනය කිරීම එක් ප්‍රධාන කාර්යයක් විය. ඒ අනුව නිත්‍යානුකූල තැන්පතුව, පරිත්‍යාග, මිලදී ගැනීම්, හුවමාරු සේවා යනාදී වශයෙන් මණ්ඩලයට ලැබී තිබුණු පොත් එකතුවෙන් රු.113,791,583 ක් වූ මිලදී ගැනීම් වටිනාකම පමණක් මූල්‍ය ප්‍රකාශනවල පොත් තොගයට ඇතුළත් කර තිබුණි. එසේ වුවත් ආයතනයේ ප්‍රධාන අරමුණු අනුව පොත් වර්ගීකරණය කිරීම, පොත්වල වටිනාකම හඳුනාගැනීම හෝ වටිනාකම හඳුනාගැනීමට කටයුතු නොකෙරුණු පොත් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට යොදාගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය සහ ජාතික උරුමයක් ලෙස වර්ගීකරණය කර ඇති පොත් සම්බන්ධ ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | 2023 ජනවාරි මාසයේ සිට ජාතික තැන්පතුවට එකතු වන සියලුම ප්‍රකාශන අගය කර ගිණුම්ගත කිරීමට හා අනාවරණය කිරීමට කටයුතු කරනු ලබන බව හා ජාතික පුස්තකාල එකතුවෙහි වටිනාකම හඳුනා ගැනීම යටතේ දැනට 2022 ඔක්තෝබර් මාසයේ සිට ජාතික එකතුවට අත්පත් කරගනු ලබන මිල සඳහන් නොවන ප්‍රකාශනවල මිල තීරණය කිරීම ද අඛණ්ඩ ව සිදු කරනු ලබන බව. | සියළුම ප්‍රලේඛන සම්පත් නිසි පරිදි වර්ගීකරණය කිරීම වටිනාකම හඳුනාගැනීම, ගිණුම්ගත කිරීම හා අනාවරණය කිරීමට අදාළ ප්‍රතිපත්ති සකස්කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.2,119,000 ක ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් හා විදේශ ප්‍රදාන රු.1,079,000 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා | මෙම අගයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කිරීම හා අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර තිබේ. එසේ | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම හා මැනීම සිදුකර නොතිබුණි. | වුව ද, ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව තව දුරටත් සිදු කළ යුතු ගැලපීම් තිබේ නම් ඉදිරි ගිණුම්කරණ වර්ෂවල දී සිදු කිරීමට අපේක්ෂිත බව. | |
| (ආ) | 2020 වර්ෂයේදී රු.895,000 ක් වැයකර ලබාගෙන තිබුණු අන්තර් ජාතික ප්‍රමිත පොත් අංක නිකුත් කිරීමේ පරිගණක මෘදුකාංග පද්ධතිය (ISBN) රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 26 වගන්තිය අනුව අස්පෘශ්‍ය වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි. | මෙම පරිගණක මෘදුකාංග (ISBN) පද්ධතිය දැනට පරිගණක හා පරිගණක උපාංග යටතේ ගිණුම්ගත කර ඇති බැවින් ඉදිරියේදී අස්පෘශ්‍ය වත්කම් යන වර්ගීකරණය යටතේ ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ඇ) | කෘමි පාලිබෝධකයින් මර්ධනය කිරීමේ ක්‍රමවේදයට හිමි පේටන්ට් බලපත්‍රය 2023 මැයි 09 දින මණ්ඩලයට භාරදී තිබියදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2023 නොවැම්බර් 24 විගණනයට ඉදිරිපත් කිරීමේදී ශේෂපත්‍ර දිනෙන් පසු සිදුවීමක් ලෙස මෙම පේටන්ට් බලපත්‍රය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 6 හි 11 (ආ) අනුව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ දී කෘමි පලිබෝධකයින් මර්ධනය කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් හිමි පේටන්ට් බලපත්‍රය ලබා ගැනීම සඳහා මණ්ඩලය විසින් ඉල්ලුම් කර ඇත්තේ 2021.05.18 දින දී ය. එබැවින් මෙය වත්කමක් ලෙස 2021 වර්ෂයේ දී ගිණුම්ගත කිරීම, ගිණුම්කරණ ප්‍රමිත 20 ට අනුව සිදු කළ නොහැකි බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | මණ්ඩලයේ කාර්යාලීය ගොඩනැගිල්ල පිහිටි ඉඩම නිදහස් ප්‍රදානයක් වශයෙන් 2021 දෙසැම්බර් 06 දින මණ්ඩලයට පවරා දී තිබුණද 1995 වර්ෂයේ එම ඉඩමේ රු.254,400,000ක්වූ තක්සේරු වටිනාකම හෝ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉඩමේ තක්සේරු වටිනාකම ලබා දී ඇත්තේ 2023.08.15 දී ය. එම අගය රු. 6,392,100,000කි. ඒ අනුව එම වටිනාකම ගිණුම්ගත කර 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | 2021 දෙසැම්බර් 6 දින ඉඩමේ අයිතිය ලැබී ඇති බැවින් ඒ වන විට තක්සේරු කර තිබුණු වටිනාකම හෝ ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශන අනුව රු.219,763 ක් වූ ඉතිරිකිරීමේ බැංකු ගිණුම් ශේෂයේ නිවැරදිතාවය සනාථ කර ගැනීම සඳහා බැංකු පාස්පොත හෝ ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | විගණිත දිනය වන විට අක්‍රිය මට්ටමේ පැවති මෙම ගිණුම සම්බන්ධයෙන් ශේෂ සහතිකයක් බැංකුවෙන් ඉල්ලා ඇතත් මේ වන විටත් ලැබී නොමැත. එය ලද වහාම විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ශේෂ සනාථන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2021 දෙසැම්බර් 31 දිනට තොග සමීක්ෂණ වාර්තා අනුව මණ්ඩලයේ අලෙවිසැලේ රු.264,303 ක් වූ පොත් 1,714 ක්ද රු.452,972 ක් වූ මණ්ඩලීය ප්‍රකාශන හා වටිනාකම සඳහන් නොවූ මණ්ඩලීය ප්‍රකාශන 10,746 ක්ද ගිණුම්ගත කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොවන මණ්ඩලයීය ප්‍රකාශන සියල්ල ඉදිරියේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | වර්ෂ අවසාන තොග ශේෂයන් නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | තැගි ඔප්පුවක් මඟින් 2019 ජූලි 19 වන දින මණ්ඩලය වෙත පවරා දී තිබුණු බණ්ඩාරගම පිහිටි පර්චස් 12 ක ඉඩම හා මහල් දෙකකින් යුත් ගෘහ භාණ්ඩ සහිත නිවස 2021 මැයි 18 දින රු.11,406,800 කට තක්සේරු කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.2,000,000 ක් පමණක් අනාවරණය කර තිබුණි. තවද එහි ඇතුළත් ගෘහ භාණ්ඩ හා රු.183,817 ක් වටිනා පුස්තකාල පොත් තොග ද ගිණුම්ගත කර නොතිබුණි. | මේ සඳහා නීත්‍යානුකූල හිමිකාරිත්වය මණ්ඩලය වෙත නොමැති හෙයින් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර, 2021 මූල්‍ය ප්‍රකාශනවලට මේ පිළිබඳ ව සටහනක් මඟින් හෙළිදරව් කර තිබෙන බව. | ඉඩමේ තක්සේරු වටිනාකම නිවැරදිව අනාවරණය කිරීම හා ගෘහ භාණ්ඩ හා පොත් තොගය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2015 වර්ෂයේ සිට මණ්ඩලයේ ප්‍රලේඛන සම්පත් සුචිකරණයේදී භාවිතාකරන පුස්තකාල කළමනාකරණ තොරතුරු පද්ධතිය (KOHA) පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙහි හිමිකාරිත්වය මණ්ඩලය සතු නොවේ. මණ්ඩලය විසින් එම පද්ධතිය පුස්තකාල තොරතුරු ගබඩා කර ගැනීමේ පහසුව සඳහා පමණක් භාවිතා කරනු ලබන බැවින් මණ්ඩලයේ වත්කමක් ලෙස ගිණුම්ගත කිරීම ගැටළු සහගත බව. | පුස්තකාල කළමනාකරණ තොරතුරු පද්ධතිය (KOHA) පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය . |

### 1.5.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| තොග වටිනාකම | 113,791,583 | 43,135,921 | 70,655,662 | මිල දී ගෙන ගිණුම්ගත කර ඇති පොත් තොගයේ පිරිවැය නිවැරදි වන අතර, නොමිල ප්‍රකාශන ද (Free of charge) ඉදිරියේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කරගෙන යනු ලබන බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |
| විකුණුම් හා බෙදාහැරීමේ පොත් තොගය | 3,123,568 | 3,239,548 | 115,979 | විකුණුම් හා බෙදා හැරීමේ පොත් තොගය ලෙස මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු.3,239,548ක අගය නිවැරදි බව. තොග සමීක්ෂණයේ දී සිදු වී ඇති දෝෂයක් හේතුවෙන් රු.115,979ක වෙනසක් පෙන්නුම් කරනු තැබුව ද එමගින් මූල්‍ය වාර්තාවලට කිසිදු බලපෑමක් සිදු නොවන බව. | වාර්ෂික තොග සමීක්ෂණ කටයුතු නිවැරදිව සිදු කිරීමට හා එම වාර්තා මූල්‍ය ප්‍රකාශන සමග සැසඳීමට කටයුතු කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2020 අගෝස්තු 14 දිනැති අංක SC & PMU/Grant/20 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය ලබාගැනීමෙන් තොරව 2020 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා ව්‍යාපෘති 2 කට අදාලව රු.15,689,163 (USD 82,500) ක් වූ විදේශ ප්‍රදාන ලබාගැනීමට ගිවිසුම්ගත වී තිබුණු අතර ඉන් ව්‍යාපෘතියක් සඳහා රු.2,117,953ක මුදලක් ලබාගෙන තිබුණි. | මින් ඉදිරියට මෙවැනි ව්‍යාපෘති සිදු කිරීමේ දී විගණනය විසින් පෙන්වා දෙන පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය දැනුවත් කර ඒ අනුව ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමට අවශ්‍ය උපදෙස් දෙන ලද බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.20,774,680 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,963,702 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,810,978ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.17,895,000 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය වෙත ලැබී තිබුණු රජයේ ප්‍රාග්ධන ප්‍රදාන රු.5,581,000 ක් උපයෝජනය කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත | ප්‍රාග්ධන ප්‍රදාන ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |